**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නිතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියෝ ගිණුම්ගත කිරීමේදී ගිවිසුම්ගත වී තිබූ රු.2,027,219 ක් වටිනාකමැති කර්මාන්ත 05ක් ණයහිමියන් බැර කර ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා ගිණුමට හර කර තිබුණි. | 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී ජ'නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ 2021 වර්ෂයේ ඉටුකළ ව්‍යාපෘති 24 ක් වෙනුවෙන් කර්මාන්ත ණයහිමියන් රු.34,428,751 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.35,077,148 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කර තිබූ වටිනාකම රු.2,182,174 ක් වූ ව්‍යාපෘති 03 ක් හා රු.600,000 වටිනාකමැති ඉඩමද ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනවල සටහන් කරන ලද බව. | -එම- |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට පරිත්‍යාග ලෙස ලද රු.24,343 ක් වටිනා තොගය ගිණුම් වලින් අතහැරී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | ගින්නෙන් විනාශ වූ නිවස පිළිසකර කිරීම සඳහා ගෙවූ රු.100,000 ක් නැවත පොදු සැපයුම් ණය හිමියෝ ලෙස ගිණුම්ගත කර තිබුණි. | වැරදීමකින් එම ශේෂය ණයහිමි ගිණුමට ගිණුම්ගත කර ඇති බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.106,143,802 ක් වූ ගිණුම් ශේෂ 02 ක් යාවත්කාලීන කරන ලද පාලන ගිණුම් නොතිබීම හා ශේෂ සනාථ කිරීමේ ලියවිලි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකිවිය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

**නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 61 | කර්මාන්ත බදු හා ව්‍යාපාර බදු සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේ දී ක්‍රමවත්ව ව්‍යාපාර සමීක්ෂණයක් සිදු කර ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මු.රෙ. 371 | අත්තිකාරම් පියවීම සඳහා දින 37 සිට දින 91 ක කාල ප්‍රමාදයක් ගතකර තිබුණි. | අත්තිකාරම් ලබාගත් කාර්ය නිම වූ විගසම අත්තිකාරම පියවීමට කටයුතු කරන බව. | කාර්යය නිමවූ විගසම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 1.8 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ වටිනාකම රුපියල් මිලියන 677.97 ක ජර්නල් සටහන් 87ක් විධිමත් අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලට ගැළපීම් කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් අනුමැතියක් සහිතව ජ'ර්නල් සටහන් මඟින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,143,743 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,180,502 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,983 | 3,428 | 3,741 | 4 | 2,995 | 3,112 | 3,107 | 5 |
| කුලී | 12,508 | 6,291 | 6,183 | 108 | 11,618 | 5,205 | 4,953 | 252 |
| බලපත්‍ර ගාස්තු | 1,258 | 1,007 | 1,026 | - | 1,058 | 1,042 | 1,042 | - |
| වෙනත් ආදායම් | 37,088 | 37,088 | 19,282 | - | 12,435 | 16,494 | 16,494 | - |
| **එකතුව** | 53,837 | 47,814 | 30,232 | 112 | 28,106 | 25,853 | 25,596 | 257 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| සියළු මූලික පහසුකම් වලින් සමන්විත ව්‍යාපාරික ආයතන විශාල සංඛ්‍යාවක් සහා බලප්‍රදේශය තුළ වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මක වෙමින් පවතින අතර කසළ එකතු කිරීම වැනි සේවාවන් සභාව විසින් සභා බලප්‍රදේශයේ බොහෝ ස්ථානවල ක්‍රියාත්මක කර තිබුණද එම ස්ථානවලින් වරිපනම් අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වරිපනම් කලාප තක්සේරු කිරීමෙන් අනතුරුව වරිපනම් බදු අයකිරීමට කටයුතු කරන බව. | සභාව මඟින් අවශ්‍ය පහසුකම් ලබා දී වරිපනම් බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබාගත් ලැයිස්තුවේ ඇතුළත් කර්මාන්ත සියල්ල කර්මාන්ත පිළිබඳ බදු ලේඛනයට, ව්‍යාපාර බදු ලේඛනයට හා වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනයට ඇතුළත් කළයුතු වුවත් එසේ සමීක්ෂණයක් සිදුනොකර ගාස්තු අයවී ඇති ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව අයවිය යුතු ව්‍යාපාර හඳුනාගෙන බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ලබන වර්ෂය සඳහා ක්‍රමවත්ව ව්‍යාපාර සමීක්ෂණයක් සිදුකර ලේඛනගත කිරීමට කටයුතු කරන බව. | සමීක්ෂණයෙන් හඳුනා ගන්නා ලද සියළුම ව්‍යාපාර ලේඛනයට ඇතුළත් කර ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| සභා බලප්‍රදේශය තුළ සන්නිවේදන ආයතන 06 ක් විසින් සම්ප්‍රේෂණ කුළුණු 22 ක් ස්ථාපිත කර ඇති අතර එයින් කුළුණු 09 ක් සඳහා 2022 වර්ෂයට අයවිය යුතු රු.27,000ක බදු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු හිමි ආයතන සඳහා ලිඛිතව දැනුවත් කළ අතර, මෙම වර්ෂයේ දී නිසියාකාරව බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**2.3 අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.1,283,910 ක මුදලක් අයකර ගැනීමට තිබුණි. | අධිභාරකරුවන් 17 ක් පළාත් පාලන අමාත්‍යාංශය වෙත අභියාචනා කර ඇති අතර, ඔවුන් නිදහස් කිරීමට හෝ අභියාචනාව ප්‍රතික්ෂේප කිරීම සඳහා වාර්තාවක් ඉල්ලා ඇති අතර, එය ක්‍රියාත්මක කරමින් පවතින බව. | ඉකුත් වර්ෂවලට අදාළ අධිභාර සහතික සඳහා මුදල් අයකර ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අත්හැර දැමූ ව්‍යාපෘතීන්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017/2018 වර්ෂවල ප්‍රදේශයේ පැවති උග්‍ර පානීය ජල ගැටළුව සහ වකුගඩු හා ඒ ආශ්‍රිත රෝග පැතිරීමේ ප්‍රවනතාවය ඉහළ යාම හේතුවෙන් පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.29,962,280 ක් වැයකර ලීටර් 5,000 ජල ටැංකි 60 ක් හා ලීටර් 2,000 ජල ටැංකි 60 ක් සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර 2017 ජූනි 30 | 2017, 2018 වර්ෂවල තිබූ පානීය ජල ගැටළුව හා වකුගඩු රෝග පැතිරීම හේතු කොටගෙන මෙම ජල ටැංකි සභාවට ලබා දුන්නද පුර නැගුම ව්‍යාපෘතිය යටතේ මෙම ටැංකි සඳහා ජලය ගෙනයාමට ජල බවුසර් 02 ක් | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර සක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතර ස්ථාපිත ටැංකි ඵලදායී ලෙස යොදාගැනීම සඳහා |

| | | | |
|---|---|---|---|
| | වන දින ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණි. නමුත් දැදුරු ඔය පානීය ජල ව්‍යාපෘතිය සහ වෙනත් ජල ව්‍යාපෘති මඟින් ප්‍රදේශයේ ජනතාව වෙත පානීය ජල පහසුකම් ලබාදීම හේතුවෙන් උක්ත ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිපල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. | ඉල්ලුම් කළ ද, ඒ වන විට එම ජල බවුසර් නොලැබිණි. එබැවින් එම ව්‍යාපෘතිය අසාර්ථක තත්ත්වයට පත්විය. ඉන්පසුව එනම් 2021 ජල බවුසර් ලැබෙන විට දැදුරු ඔය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී තිබුණු බව. | විකල්ප වැඩපිළිවෙලක් පිළිබඳ අවධානය යොමුකළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රධාන යටතේ පොල්පිතිගම මහයාය ජල ව්‍යාපෘතියේ ගිල්වන ළිඳ ඉදිකිරීමට හා ජල ටැංකිය ඉදි කිරීම සඳහා රු.4,908,057 ක් ප්‍රතිපාදන ලැබී තිබූ අතර, ජල පොම්පාගාරය ඉදි කිරීමට ප්‍රතිපාදන ලබා නොදීම නිසා ජල ව්‍යාපෘතියෙන් ප්‍රතිපල ලබා ගැනීමට නොහැකිව ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | මෙම ව්‍යාපෘතියේ ජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා පළාත් ජල ඒකකය මඟින් 2023 වර්ෂයේ දී ප්‍රතිපාදන ලබා දෙන බව ප්‍රකාශ කර ඇති අතර, මෙම වර්ෂයේ දී අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන බව.. | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර ඒ අනුව ප්‍රතිපාදන සලසාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට හිමිකම් ඇති වටිනාකම තක්සේරුකර නොමැති ඉඩම් 02 ක්, ජල ව්‍යාපෘති 04 ක්, පරිත්‍යාග ලෙස ලද කොන්ක්‍රීට් මිශ්‍රන යන්ත්‍ර 02 ක් හා ජෙනරේටරයක්ද ඇතුළු වත්කම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් තක්සේරු කර ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කරන ලද බව. | ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කළයුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල්පිතිගම ප්‍රාදේශීය සභාව සතුව වාහන 32 ක් පැවති අතර ඉන් වාහන 05 ක් භාවිතයට ගත නොහැකිව අබලන් තත්ත්වයේ පැවති අතර ඉතිරි වාහන 27 න් වාහන 12 ක් සඳහා විගණිත දින වන විටත් 2023 වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ආදායම් බලපත්‍ර ලබාගෙන වාහන යෙදවීමට ක්‍රියා කළ යුතු අතර වාහනයේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. |